# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 388/2024` | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திக<br>Date | 05/03/2024<br>පැය 1510 |

## මාධ්‍ය නිවේදනය

### මාධ්‍යවල පලවූ පුවතක් සම්බන්ධයෙන් කරුණු පැහැදිලි කිරීම - පොලිස් මූලස්ථානය.

ඌව පළාත් ආණ්ඩුකාරතුමා වන ඒ.ජේ.එම් මුසම්මිල් මහතාගේ පුත්‍රයෙකු විසින් වැල්ලවත්ත පොලිස් වසමේ පිහිටි මහල් නිවාසයකදී කාන්තාවකට සිදු කල පහරදීමක් පිලිබඳව දින කිහිපයකට පෙර වැල්ලවත්ත පොලිස් ස්ථානය වෙත පැමිණිල්ලක් ලැබී තිබිණි. එම පහරකෑමට ලක් වූ කාන්තාව රෝහල් ගත වී තිබිණි. මෙම සැකකරු අත්අඩංගුවට ගැනීමට යාමේදී වරද සිදු කිරීම සඳහා ඔහු ගමන් කල වාහනය සහ ඔහුගේ ජංගම දුරකථනය දකුණු පළාතේ ස්ථානයක තබා පොලිසිය නොමඟ යැවීමට කටයුතු කර ඇති බවට නිරීක්ෂණය වී ඇති අතර සැකකරු වෙනත් ප්‍රදේශයකට සැඟව සිටීම සඳහා පලාගොස් තිබිණි. එම වාහනය හා ජංගම දුරකථනය මේ වන විටත් පොලිසිය භාරයට ගෙන ඇති අතර මේ දක්වා සැකකරු අත්අඩංගුවට ගැනීමෙන් වැළකී සිටිම සඳහා සැඟවී සිටින බව වැල්ලවත්ත පොලිසිය විසින් දන්වා ඇත.

සැකකරු අත්අඩංගුවට ගැනීම සඳහා තවදුරටත් විමර්ශන සිදු කරමින් පවතින අතර, සැකකරු පොලිසිය වෙත භාර වන බවට ඔහු විසින් හෝ ඔහුගේ පියා වන ආණ්ඩුකාරතුමා විසින් හෝ සෘජුව පොලිසිය වෙත කිසිදු අවස්ථාවක දැනුම් දී නොමැත. එසේම එවැනි දෙයක් පොලිසිය විසින් පිලිගැනීමක්ද සිදුකර නොමැත.

ඉහත තත්ත්වය සම්බන්ධයෙන් ඌව පළාත් ආණ්ඩුකාරතුමා විසින් සිදු කර ඇති ප්‍රකාශයක් පිලිබඳව මාධ්‍ය මඟින් පල වී තිබුණි. වර්ථමාන නිවැරදි තත්ත්වය පැහැදිලි කිරීමක් ලෙස මෙම පුවත ඔබ වෙත යොමු කරමි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**